# ජාතික අධ්‍යාපන ආයතනය

## බ්‍රේල් සහතික පත්‍ර පාඨමාලාව - 2022

## ඉල්ලුම්පත් කැඳවීම

ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන උක්ත පාඨමාලාව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් :**

- අ.පො.ස. සාමාන්‍ය විභාගය සමත්වීම සහ අ.පො.ස. උසස් පෙළ විභාගය සමත්වීම හෝ ඊට ඉහළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම.
- රජයේ පාසල්, උපකෘත පාසල් හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීමේ කටයුතුවල නියුක්ත ගුරුවරයෙකු වීම.
- දෘෂ්ටි ඌණතා සහිත දරුවන් සිටින හෝ එම දරුවන් සමග කටයුතු කිරීමට කැමැත්තක් දක්වන හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයකු වීම.
- වයස අවුරුදු 18-50 අතර වීම.

**ගාස්තු :**

| | | |
|---|---|---|
| පාඨමාලා ගාස්තු | - රු. | 20,000.00 |
| ඉල්ලුම්පත් ගාස්තු | - රු. | 200.00 |
| ලියාපදිංචි ගාස්තු | - රු. | 1,000.00 |

**පාඨමාලවේ අන්තර්ගතය :**

- බ්‍රේල් ඉගැන්වීම පිළිබඳ කුසලතා
- බ්‍රේල් මගින් (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) භාෂා කුසලතා
- බ්‍රේල් ගණිත කුසලතා
- බ්‍රේල් සඳහා වෙනත් සහ නව භාවිතයන්
  (බ්‍රේල් ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත්ය)

**ඉල්ලුම් කළ යුතු පිළිවෙල :**

- ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නම, තනතුර, රාජකාරී හා පෞද්ගලික ලිපිනය, දුරකථන අංකය, උපන් දිනය, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් ඇතුළත්වන සේ තමා විසින් පිළියෙල කරගත් ඉල්ලුම්පතක්, මහරගම ලංකා බැංකුවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 607628 දරන ගිණුමට බැරවන සේ දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකට රු. 200/- ක මුදලක් ගෙවා ලබාගත් කුවිතාන්සිය සමග **"අධ්‍යක්ෂ, අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම"** යන ලිපිනයට 2022 අප්‍රේල් මස 15 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ) ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"බ්‍රේල් සහතික පත්‍ර පාඨමාලාව - 2022"** යනුවෙන් සඳහන් කළ යුතුයි.
- සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
- දේශන මාර්ගගතක තාක්ෂණය (Zoom) ඔස්සේ සහ ජාතික අධ්‍යාපන ආයතනයේදී ද පැවැත්වේ.

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න**
**අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**

2022.03.14